# ජනප්‍රිය සාහිත්‍යය

## (19 වන සියවසේ සිංහල පද්‍ය සාහිත්‍යය ඇසුරෙනි)

*ඔලගන්වත්තේ චන්දසිරි හිමි* [1]

***ABSTRACT***

***This article discusses new poetical tradition and salient features of 19th centuary of British colonial period of Sri Lanka. Moving concurrently are the features of popular poetry and narrative poetry to be discussed. The dawn of printing technology gave rise to the popular pamphlet poetic tradition (kavil kola) this is also discussed. The new poetic tradition is considered to be a transition period in modern literature. Most materials used in this article have been obtained from publications and materials available at the Colombo Museum, the Department of Historic Documents in the main Library of the University of Peradeniya, the Asia and African Sections and Social Science Sections of the British Library in London.***

[1] **Dr.Ven Olaganwatte chandasiri thero, Senior Lecturer BA (Hons) in Sinhala (SJP) MA in Sinhala (SJP) SEDA (UK) Ph.D (PDN). Department of Humanities E-Mail: chandrasirihimi@hotmail.com**

## හැඳින්වීම (Introduction)

ශ්‍රී ලාංකේය සාම්ප්‍රදායික සමාජය බටහිර ආක්‍රමණවලට හසුවීම හේතුවෙන් විශාල පරිවර්තනයකට භාජනය විය. පෘතුගීසි, ලන්දේසි ආක්‍රමණවලින් අනතුරුව ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට යටත් වීම මේ විපර්යාසයෙහි කඩඉමක් විය. මුළු ලංකා ඉතිහාසය ම 19 වන සියවස තුළ දී නව මගකට යොමු කොට ශීඝ්‍රයෙන් වෙනසක් කරා යොමුවීමට ප්‍රධාන වශයෙන් ම හේතු වූයේ බ්‍රිතාන්‍යයන් විසින් නිර්දේශ කරන ලද ප්‍රතිසංස්කරණ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම යි. මෙම සමාජ පරිවර්තනය ආර්ථික, දේශපාලන, සංස්කෘතික, ආගමික හා සාහිත්‍ය යන අංශ ගණනාවක ම ඇති විය. ඉංග්‍රීසි පාලන සමය තුළ මුද්‍රණ තාක්ෂණය ව්‍යාප්තියත් සමඟ සිංහල සාහිත්‍යයෙහි ද පැහැදිලි වෙනසක් ඇති විය. බටහිර සාහිත්‍යයෙහි බලපෑම මත සාම්ප්‍රදායික සිංහල සාහිත්‍ය සම්ප්‍රදායෙහි විවිධතා ඉස්මතු වන්නට විය. මුද්‍රණ තාක්ෂණය ව්‍යාප්තියත් සමඟ 19වන සියවසෙහි සාම්ප්‍රදායික සිංහල පද්‍ය සාහිත්‍යයෙහි ඇති වූ පරිවර්තනය පිළිබඳව විධිමත් පර්යේෂණයක් මෙතෙක් සිදු කර නොමැත. මේ ලිපියෙහි මුඛ්‍ය පරමාර්ථය වන්නේ 19වන සියවසෙහි සිංහල පද්‍ය සාහිත්‍යයෙහි ඒක දේශයක් විවරණය කිරීමයි. මේ ලිපියට අදාළ දත්ත පරිශීලනයේ දී ශ්‍රී ලංකා පේරාදෙණිය විශ්ව විද්‍යාලයීය පුස්තකාලය, කොළඹ ජාතික කෞතුකාගාර පුස්තකාලය හා මහා බ්‍රිතාන්‍ය පුස්තකාලයෙහි මූලාශ්‍රය ද භාවිත කරන ලදී.

## නූතන සිංහල පද්‍ය සාහිත්‍යයෙහි නව ද්වාරය විවෘත වීම

නූතන සිංහල සාහිත්‍ය සමාරම්භයෙහි ලා පරිවර්තන, පද්‍ය ආඛ්‍යාන හා නාටක යනාදිය නිසා පාඨකයාගේ රුචිය එක් අතකට ගමන් කළ අතර ම වාද විවාද, පත්‍ර හා සඟරාදිය නිසා නූතන සාහිත්‍ය ගොඩ නැඟීමට අවශ්‍ය සුඛනම්‍ය භාෂාව ගොඩ නැගුණු බව සරච්චන්ද්‍ර මතය වේ. ඒ අතර ම 19වන සියවසේ මුද්‍රණ තාක්ෂණය පැතිර යෑමත් සමඟම එම පද්‍ය ආඛ්‍යාන විශාල ප්‍රමාණයක් මුද්‍රණයෙන් ප්‍රකාශයට පත් විය. පුවත්පත් හා සඟරාවල නිරන්තරයෙන් ම කතා පළ වූ අතර ම ඒ කතා කියවීමේ රුචිය තව දුරටත් වැඩිවීම පද්‍ය ආඛ්‍යාන නිසා ඇති විය. මෙම බොහෝ කථාවල ගිහි ජීවිතය සම්බන්ධ ප්‍රවෘත්ති අන්තර්ගතව ඇත. (සරච්චන්ද්‍ර,1997:26)

පද්‍ය ආඛ්‍යාන (Narrative poetry) යන්න ලොව ජනප්‍රිය මාතෘකාවකි. (Ruth bass &morrilla,1998:81) පද්‍ය ආඛ්‍යානයන් සඳහා කිසියම් සිද්ධියක්, චරිතයක්, සමකාලීන සමාජ සන්දර්භය තුළින් ම වස්තු විෂය වේ. එහි කිසියම් කථා ප්‍රවෘත්තියක් ද (Plot) අන්තර්ගත වේ. සමකලීන අත්දැකීම් පසුබිම් වීමද මෙහි පැනෙන විශේෂත්වයකි. මෙම සිදුවීම් තුළ කිසියම්

ආකාරයක සංවිධානාත්මක ස්වරූපයෙන් තොරතුරු සංග්‍රහ කිරීමක් ද දැක ගත හැකි යි. පද්‍යයන්හි චරිත ද විටින් විට වෙනස් වේ. (Levy,1988:104-105)* පද්‍ය ආඛ්‍යාන සඳහා මනඃකල්පිත ප්‍රබන්ධ කථාවක් ද වස්තු විෂය විය හැකි යි. මානව අත්දැකීමක් ආශ්‍රයෙන් කථා කරන හෝ ලියන භාෂාවකින් පාඨකයාට රසවින්දනයක් ගෙනදීමේ අරමුණකින් යුක්තව ම මෙය රචනා කෙරේ. වඩාත් සංවේදී ස්වරූපයෙන් ම ඉදිරිපත් කිරීම ද විශේෂත්වකි. සමස්තයක් වශයෙන් උපයුක්ත භාෂාව ද විශේෂ වුවකි. විශේෂ චරිත හඳුන්වා දීම සඳහා විශේෂණ පද යොදා ගනී. කොහේ දී? කෙසේ ද? කොහොම ද? යන කාරණා පැහැදිලි කර ගත හැකි ආකාරයෙන් ම පද්‍ය ආඛ්‍යාන ඉදිරිපත් කරන අතර ම පාඨකයාගේ මනසෙහි චිත්ත රූපයක් මැවෙනා පරිද්දෙන් භාෂාව උපයෝගී කර ගනී. (Google book,2002:4)*[1]. මෙම න්‍යායාත්මක පදනම සලකා බලන කල්හි සරච්චන්ද්‍ර පද්‍ය ආඛ්‍යාන යනුවෙන් නාමික භාවිතයක් සිදු කර ඇති අතර ම මෙහි ප්‍රකාශිත න්‍යායාත්මක පදනමක සිටි තම අදහස ප්‍රකාශ නොකළ බව පෙනේ. මෙම පද්‍ය ආඛ්‍යාන ජනප්‍රිය සාහිත්‍යයක් ලෙස ගොඩ නැගිණි.

සිංහල සාහිත්‍ය ඉතිහාසයෙහි මහනුවර යුගය හා 19වන ශතවර්ෂයෙහි රචිත ඇතැම් පද්‍ය කාව්‍යයන් ජනප්‍රිය සාහිත්‍යංගයක් ලෙස හඳුන්වා දීමට සී. ඊ ගොඩකුඹුර උත්සහා ගෙන ඇත. නිර්නාමිකව පෙනීසිටිමින් කලාකෘතින් වශයෙන් නොව පොදු ජනයා අතර ජනප්‍රිය කථාන්තරයක් පද්‍ය ස්වරූපයෙන් ඉදිරිපත් කිරීමත් එය ජනතාව අතර ප්‍රචලිත වීමත් එය ජනප්‍රිය සාහිත්‍යංගයක් ලෙස ගොඩ නැගීම සඳහා හේතු වූ බව පෙන්වා දෙයි.(Godakumbura,1996:277)*[2] මේ අතර ම The Popular Poetry of the Sinhalese(Silva,1917) යන ලිපිය බොහෝ දෙනෙකුගේ අවධානයට යොමු විය යුත්තකි. ( popular poetery always had its recognized place. It represented the natural expression of the lives and views of the Sinhalese.) මෙම ලිපිය මගින් ජනප්‍රිය සාහිත්‍යයෙහි පවතින පද්‍ය කෘති මෙසේ වර්ග කර පෙන්වා දෙයි.

i. Religious poetry

ii. Stories from Buddhist Jataka

iii. Stories drawn from tradition and folk tales

iv. Poems on incidents connected with history of Ceylon

v. Poems on arts and industries

vi. Poetry connected with games and amusements

(Silva, 1917:3-4)

මෙම කතුවරයා මෙසේ ජනප්‍රිය සාහිත්‍ය ලෙස මෙම වර්ගීකරණයක් කර ඇත ද , 19වන සියවසේ මුද්‍රණයෙන් ප්‍රකාශයට පත් වී ඇති විශාල වූ පද්‍ය පුස්තිකාවන්ගේ අන්තර්ගතයන් මෙම වර්ගීකරණයන්ට ඇතුළත් වී නොමැති ය. (චන්ද්‍රසිරි හිමි, 2008) *[3] මෙම ලේඛකයන් භාවිත කරන popular poetry යන සංකල්පය මුද්‍රණ ශිල්පය ව්‍යාප්තියත් සමඟ බිහි වූ පද්‍යකෘතින් සඳහා භාවිත කිරීම ද සාධාරණ ය. ඊට හේතුව වන්නේ මුද්‍රණ තාක්ෂණය ලෝකයෙහි ව්‍යාප්තියත් සමග ජනයාගේ අධ්‍යාපන මට්ටම ද ඉහළ ගියේ ය. ජනතාව අතර තොරතුරු සංක්‍රමණය ද වැඩි විය. අධ්‍යාපන මට්ටම ව්‍යාප්ත වීමෙහි එක් ප්‍රතිඵලයක් ලෙස ගුණාත්මක බවින් අඩු සාහිත්‍යයක් ( Cheap literature ) ව්‍යාප්ත වන්නට විය. මෙම සාහිත්‍යාංගය වඩාත් ජනප්‍රිය තත්ත්වයට පත් වූයේ පහළ පංතියේ සමාජ ස්ථරයෙහි ය. (Haywood, 2004)*[4] ජනප්‍රිය හා රසවත් කතාවක් ඉදිරිපත් කිරීම මෙම සාහිත්‍යාංගයෙහි විශේෂත්වයකි. මුද්‍රණයෙන් ප්‍රකාශයට පත් වී ඇති ඇතැම් කාව්‍ය කෘතියක ජන කාව්‍ය සම්ප්‍රදාය හා පද්‍ය ආඛ්‍යාන සම්ප්‍රදාය ඉක්මවා ගිය නිර්මාණාත්මක ස්වභාවය ද දැකගත හැකි අතර ම කාව්‍යයෙහි ගුණ දොස් පිළිබඳව ද දැනීමක් තිබූ බව දැකගත හැකි ය. ආරිය රාජකරුණා ද සඳහන් කරන්නේ දහනව වන සියවසේ අවසානයේ දී මුද්‍රණ ශිල්පය ව්‍යාප්ත වත්ම ජනප්‍රිය වූ මේ කාව්‍ය සම්ප්‍රදාය නියත වශයෙන් ම අලුත් යැයි කිව හැකි කාව්‍ය සම්ප්‍රදායකට මග පෑදීමක් බව ය. (රාජකරුණා,2008:373) මෙකී කාව්‍ය සම්ප්‍රදාය කිනම් ස්ථානයක ස්ථානගත කරන්නේ ද යන්න ද ගැටළු සහගත තත්ත්වයකි.

මෙම ජනප්‍රිය සාහිත්‍ය තුළ පැරණි ජනකතා වත්මන් ස්වරූපයෙන් ඉදිරිපත් කිරීම ද විශේෂත්වයකි. එක්තරා කලෙක රජ කෙනෙකුට ඇති වූ රෝගාබාධයක් සුව කිරීමට හේනයා ඉදිරිපත් වෙයි. මෙය වර්තමාන කථාවක් ලෙසින් කියයි. (අප්පුහාමි,1894) 19වන ශතවර්ෂය වන විට ඉන්දියානු සමාජය තුළ ද මුද්‍රණ ශිල්පය ව්‍යාප්තියත් සමඟ ම පද්‍ය ආඛ්‍යාන ජනප්‍රිය වන්නට විය. එය නාගරික ජනතාව අතර ද ප්‍රසිද්ධියට පත් විය (Orsini Franceca:111). ලාංකේය සමාජ සන්දර්භය තුළ ප්‍රසිද්ධ පද්‍ය ආඛ්‍යාන නාගරික හා ග්‍රාමීය ජනතාව අතර ප්‍රකට වූවකි. නිර්මාණාත්මක ලේඛනයක් නොවන නියමිත අධ්‍යාපනයක් නොමැති මෙවැනි රචකයන්ගේ මෙවන් ආඛ්‍යාන chapbooks ලෙස ඉන්දියානු සාහිත්‍යයෙහි හඳුන්වා ඇත. (Orsini Franceca:8). විශාල පද්‍ය ප්‍රමාණයක් නොවන, කිසියම් සිදුවීමක් ආශ්‍රයෙන් ගොනු කරන ලද මෙවැනි පද්‍යය බොහෝ දෙනෙක් "කවි කොළ" නැමති සාහිත්‍යාංගයට ඇතුළත් කරති. ගනනාත් ඔබේසේකර මෙන් ම නීරා වික්‍රමසිංහ ද 19වන සියවසේ මුද්‍රණයෙන් ප්‍රකාශයට පත් වී ඇති පද්‍ය කාව්‍යය *කවි කොළ* නැමති සාහිත්‍යාංගයට ඇතුළත් කළ හැකි බව පවසති. (Wicramasinhe,2006:78)*[5] , මෙවන් කෘති *කවි කොළ* නැමති සාහිත්‍යාංගයට එක් කිරීම සාධාරණය නොවේ. එය සමස්ත පද්‍ය සාහිත්‍යයම අධ්‍යයනයක් මගින් කළ නිගමනයක් නොවේ.

එමෙන් ම 19වන සියවසේ ඉන්දියානු සමාජයෙහි බිහි වූ ගැමි කාව්‍ය, නාට්‍ය හා නව කතා සියල්ල ජනප්‍රිය සාහිත්‍යංග ලෙස පෙන්වා දී ඇත.*6

සම්භාව්‍ය සාහිත්‍යය බිහිවීමෙහි ලා ප්‍රභූ පක්ෂයේ අනුග්‍රහය ලැබුණමුත් එම ස්වභාවය කෝට්ටේ යුගයෙන් පසුව ක්‍රමයෙන් අඩුවන්නට විය. 19වන සියවසේ මුද්‍රණයෙන් ප්‍රකාශිත පද්‍ය කාව්‍යයන්හි සාම්ප්‍රදායික ජාතක කථා රාශියක් ම දැක ගත හැකි ය. නිමි ජාතක කාව්‍යය, (තේමියජාතක විරිදුපොත , 1886 : 67 පද්‍ය) උම්මග්ග ජාතක කාව්‍යය, (උම්මග්ග ජාතකකාව්‍යය,1874:300පද්‍ය) වෙළඳ රාජ මංගල්‍යය (වෙළඳරාජ මංගල්ලය, 1893:130පද්‍ය) කුම්මාස පිණ්ඩ ජාතක කාව්‍ය, (කවිශේඛර, 1895:173පද්‍ය) තුන් යහලු පුවත, (අප්පුහාමි ,බු.ව:2437) කුස රාජ මංගල්‍යය, (නැකත්නා ,1894:111පද්‍ය), (ප්‍රේරා, 1877:169 පද්‍ය) දේව ධර්ම ජාතකය (පෙරේරා ,1886:83පද්‍ය) කාපිරි කුමාරයාගේ කතාව, තර්ක ජාතක කාව්‍යය, සූකර ජාතක කාව්‍යය යනාදි ය මෙහි දී පැහැදිලි කළ හැකි වේ. මෙම ජාතක කථාවන්ට වඩා තත්කාලීන සමාජ සිද්ධි පදනම් කර ගනිමින් කරන ලද පද්‍ය ආඛ්‍යාන වඩාත් රසවත් ලෙස ඉදිරිපත් කර ඇත. අලුත් කඩේ උසාවිය ළඟදී සිදු වුණ මරණයක් හෙවත් දූලියානු කථාව නොහොත් අවවාද මල්දම(ප්‍රේරා,1895) වූ කලී අලුත් කඩේ උසාවිය අභියස දී සිදු වූ මිනී මැරුමක් හා සම්බන්ධ වූ සිද්ධියක් ආඛ්‍යාන ස්වරූපයෙන් ඉදිරිපත් කරන ලද්දකි. මෙහි පැහැදිලි කතාවක් ඇති අතර ම පාඨකයාට කිසියම් කථා රසයක් ද ගෙන දෙයි. තත්කාලීන සමාජ සිද්ධියක් පදනම් කර ගනියි. මෙහි දැක්වෙන කථාව වූ කලී පිටිසර පළාතකින් කාන්තාවක් කොළඹට පැමිණ නිවසක මෙහෙය කිරීමෙන් පසු ඇට ලැබුණු දූලියානු නම් වූ දියණිය ජුවන් පෙරේරා නැමැත්තාට සරණපාවා දීමත් පසුව වෙනත් තරුණයකු ජුලියානුගේ සිත් ඇද ගැනීමත් සමඟ ම පෙරේරා නඩු දැමීමත් අවසානයේ දී සිතේ තිබුණු දැඩි වේදනාවට තරුණයා ජුලියානුට පිහි පහර දීමත් ය. දූලියානුගේ මවගේ විලාපය පෙන්නුම් කිරීම සඳහා යොදාගෙන ඇති භාෂාව වූ කලී භාෂණ ව්‍යවහාරය ම වේ.

ජුවන් මගේ දුව බැඳලා උන්නා එක පව් ලේ
නමින් නපුරු කිට්ටා පැමිණ කලා අපට අවුලේ
එයින් තමයි මේ අනතුරු සිද්ද වුනේ මෙ කලේ
දරන් ඉන්නේ කෙලෙසද මම මේ කාරණ මෙ කලේ

(ප්‍රේරා ,1895:28 පද්‍ය)

(මගේ දුව ජුවන් සමග විවාහ වී ඉන්නා කළ කිට්ටා නමින් යුත් පුද්ගලයෙක් පැමිණිම නිසා මෙම ගැටළුව ඇති විය.)

මෙහි දී *කිට්ටා* යන අන්වර්ථ නාමයෙන් කථාවට අදාළ වූ ප්‍රධාන චරිතය හඳුන්වා දෙන අතර ම ඔහු පිළිබඳව චිත්ත රූපයක් ද පාඨක සිත්තුළ මවාලන්නට සමත් වී ඇත. පාඨක සිත් කම්පාවන ස්වරූපයෙන් යම් යම් අදහස් ප්‍රකාශ කිරීම ද ආඛ්‍යානයන්හි විශේෂත්වයකි. සිපිරි මාලය

හෙවත් සිරකාරයාගේ විලාපය (සපිරිමාලය,1888) වූ කලි සිරකරුවෙක් දුක් විඳින ස්වරූපයෙන් ඉදිරිපත් කරන ලද්දකි.

හපලා කන්ට බැරි බත් ටික ගල් එ ක්ක
උයලා ලබුහොද්ද දියකල කහළු ක්ක
අනලා ගම්මිරිස් එතු කුඩුකර එ ක්ක
කාලා ඉන්ට බැරිදනවා මගේ බො ක්ක (සපිරිමාලය,1888:61)

(බත් කන විට ගල් ද හැපෙයි. කහ සහ ලුණු දමා ලබු හොද්ද හදා ඇත. ගම්මිරිස් සහ ලුණු අනා කෑවට පසුව මගේ බඩ දනවා)

මෙම කාව්‍යයන්හි කිසියම් නිර්මාණාත්මක භාෂා විලාසයක් දක්නට නොමැති අතර ම හුදෙක් කථාවක් (Plot) පමණක් ම දැක ගත හැකි ය. මෙහි නිර්මාණය හුදෙක් පාඨක කතා රුචිය පිරිමැසීම පමණක් සිදු වන බව පෙන්වා දිය හැකි ය. කටුගම්පල හටනය හෙවත් කටුගම්පල පල්ලේගම නම් ග්‍රාමයෙහි සිදු වූ බලවත් කෝලාහලය සම්බන්ධ තොරතුරු (ප්‍රේරා,1892) පල්ලේගම බන්ඩා සහ ගුණරත්න දෙදෙනා අතර ඉඩමක් සම්බන්ධයෙන් ඇති වූ ආරවුලක දී පොළු පිස්තෝල ඩයින මයිට් ආදි අවි රැගෙන කරන ලද කෝලාහාලය විස්තර කරයි. මෙහි දී කෘතිය ආරම්භයේ දී කථාවේ මූල බීජය විස්තර කිරීම ද විශේෂයෙන් ම දැක ගත හැකි ය. (ප්‍රේරා,1892:3-4පද්‍ය)

රකුසන් ලෙසින් මුන් සැම තුල්ලෙ වලාසි ට
කඩමින් පොල් කුරුම්බා ගස් පාළු කො ට
කුකුළන් සැවොම අල්ලා සිවඑන් ලෙස ට
කෙරුවෙන් නොයෙක් කොලහල බියකරු ලෙස ට

(ප්‍රේරා,1892:41පද්‍ය)

(රකුසන් ආකාරයෙන් පොල් කුරුම්බා කඩා ගස් පාළු කර කුකුළන් ආදි නොයකුත් සත්වයන් ද විනාශ කරමින් මහත් වූ කෝලහලයක් කෙළේ ය.)

මුද්‍රණයෙන් මෙවැනි සිද්ධි ප්‍රකාශයට පත්වීමට හේතු වී ඇත්තේ තත්කාලීන ප්‍රසිද්ධ සමාජ සිද්ධි ලෙස සමාජයෙහි කථාබහට ලක්වීම නිසා ය. (මරක්කල හටනේ හෙවත් සිංහල මරක්කල කෝලාහලය ,1891) නම් කෘතියෙහි ද පැහැදිලි කථාවක් දැක ගත හැකි යි. මොරටුවේ කරාවේ කුලයට අයත් තරුණයෙක් කොළඹ අලුත් පාරේ මුස්ලිම් නිවසක ගැතියක් සමඟ අනියම් සම්බන්ධකමක් පවත්වා ඉන් අනතුරුව මේ දෙදෙනා අතර මිත්‍රකමක් ගොඩනැඟීම සිදු වේ. මෙම තරුණයා මුස්ලිම් කාන්තාව මොරටුවට හොර රහසේ ම රැගෙන යයි. මෙයින් කැළඹීමට පත් වී දෙපාර්ශ්වය අතර ආරවුලක් හට ගනී.

කොළඹ සිටත් මරක්කල  කරත්ත රතවල නැගි   ලා
දෙරන ගමන් ගත්ත ලෙසට මොරටුගමට ගොස් පිරි   ලා
රැගෙන ඇවිත් අපේ ලියක් මෙගමෙහි ඇත  සගවා   ලා
උරන වෙලා අසති සැවොම තැන තැන සිට සැංගී   ලා

(මරක්කල හටනේ හෙවත් සිංහල මරක්කල කෝලාහලය ,1891:34පද්‍ය)

(කොළඹ සිට මරක්කල ජනයා කරත්තවලින් මොරටුවට ගොස් අපේ කාන්තාවක් මේ ගමට සඟවා ඇතැයි යනුවෙන් මොරටුවේ ජනයාගෙන් අසති)

දෙපාර්ශ්වය අතර කෝලහාලයක් හට ගනී. අවසානයේ දී මරදානේ පොලීසියට දෙපාර්ශ්වයේ ම පිරිස පැමිණ ප්‍රශ්න විසඳීම සිදු කරයි.

නඩු අසණා තුන්පලනරණ හමුවට රැගෙනණා උන්සිටුවමි   ණ
යොන් විසිණා පැමිනිල්ලගෙණා කිව්මෙමතරුණ වන්වාලෙසි   ණ

මච්විසිණා රැකඋන්නිතාණා අඩුවයස්වණා ළදරියරැගෙ   ණා
ගිය බැවිණා ආගම නැසුණා අපකුලයවිණ සයඋනුබැව්   ණ

( නඩුව ඇසීම සඳහා මුස්ලිම් සිංහල හා  නව යුවළ ද එක් කර ගනියි. මව විසින් ඉතා ම ආදරයෙන් රැකගෙන සිටි අඩු වයස් ඇති ළදරිය මෙම තරුණයා රැගෙන යෑම අපේ ආගම විනාශ වූනේ ය යැයි මුස්ලිම් ජනයා පවසති. )

කිසියම් චරිතයක්. උපහාසයට පත් කිරීම සඳහා ද ආඛ්‍යාන යොදා ගනී. සංවාද ස්වරූපයෙන්  ආඛ්‍යානයක් ඉදිරිපත් කිරීම ද විශේෂත්වයකි. මාතර ප්‍රදේශයේ එක්තරා ප්‍රසිද්ධ පෙරකදෝරුවෙකුගේ චරිතයක් උපයෝගී කරගෙන (පෙරකදෝරු හටනේ,1869) රචනා කොට ඇත. මෙහි කතා ප්‍රවෘත්තිය වන්නේ එක පියකුට තමන්ගේ පළමු විවාහයේ දී බිරිඳ මිය ගිය පසු ඉතිරි වූ පුතු ද ඉන් පසුව රැගෙන ආ දෙවැනි විවාහයේ බිරිඳට ලැබුණු පුතු ද සමග ඉඩමක් සම්බන්ධයෙන් හටගත් වියවුලේ දී එය බේරා ගැනීම සඳහා නඩුවක් කීම සම්බන්ධයෙන් මෙහි තොරතුරු අන්තර්ගත වෙයි.  නඩුව  පිළිබඳව පෙරකදෝරුවාට දැනුම් දීමට පෙරකදෝරුවාගේ ගෙදරට ගැමියා  කදක් බැඳගෙන යයි. මුළු කථාව ම  සංවාද ස්වරූපයෙන් ම ඉදිරිපත් කොට ඇත.

පෙරකදෝරු දුටු එක   ලේ
හනික  මෙලෙස කියයි   ලො ලේ
ගමට ගොසින් තුඹරා   ලේ
ගෙණ එව මකියන සිය   ලේ

දෙසිත් දොඩත් ජමනාරං ර සේ යා
වැලත් සමග වරකා ගෙණ තො සේ යා
අළුත් වැලි හකුරු මුල් බැඳ මෙසේ යා
ගෙණැත් දෙව කන්ඩ නෝනටය සේයා

(පෙරකදෝරු හටනේ,1869:27-28පද්‍ය)

(පෙරකදෝරු තැන ඉක්මනින් ම මෙලෙස කියයි. ගමට ගොස් දොඩන්, ජමනාරං, වරකා, වැලි, හකුරු මුලක් බැඳගෙන අපේ නෝනාට කන්ට දෙන්ට යැයි කියයි.) අවුරුදු තුනක් නඩුව කීව ද අවසානයේ දී ගැමියා සිරගෙට ගොස් දුක් විඳිනා ආකාරය සංවේදී ස්වරූපයෙන් ප්‍රකාශ කරයි.

සිරගෙයි ඔහු ඉන්න කල ට
මාස තුනක් යන අතර ට
අතීසාර ලෙඩක් ඔහු ට
වෙලා මැරුණි අසද්දය ට
(පෙරකදෝරු හටනේ,1869:112පද්‍ය)

(සිරගෙයි මාස තුනක් ඉන්නා කළ අතීසාරය නම් ලෙඩ සැදී ඔහු මරණයට පත් විය.)

මෙවැනි ආඛ්‍යානයන්හි ඇති විශේෂත්වය වන්නේ හුදෙක් කතාවක් කීම පමණක් වන අතර ම නිර්මාණාත්මක භාෂා ශෛලියක් උපයෝගී කරගෙන නොමැති බව පැහැදිලි ය. සාම්ප්‍රදායික කාව්‍ය කෘතීන්හි ඇති විවිධ අලංකාර මෙම ආඛ්‍යානයන්හි දැක ගත නොහැකි යි. සිංහල සම්භාව්‍ය සාහිත්‍යයෙහි පද්‍ය සාහිත්‍ය සඳහා ජාතක කතා වස්තු විෂය වී ඇති අතර ම ඒවායෙහි පැහැදිලි කතාවක් දැක ගත හැකි අතර ම උපයුක්ත භාෂාව හා කාව්‍ය සංකල්ප නිර්මාණාත්මක ස්වරූපයක් ගනී. කව්සිළුමිණ මේ සඳහා හොඳම උදාහරණය ලෙස පෙන්වා දිය හැකිය. එහෙත් 19වන සියවසේ ආඛ්‍යාන රචකයන්ට අවශ්‍ය වී ඇත්තේ සාටෝපවත් භාෂා ශෛලියක් භාවිත කිරීම නොව නිදහස් ලෙස කතාවක් ඉදිරිපත් කිරීම ය. එළිවැට තිබීම හෝ නොතිබීම ඔවුනට ප්‍රශ්නයක් නොවී ය. විරිත ද ප්‍රශ්නයක් නොවීය. (සත්‍යාලංකාරය,1876:114) නමින් යුක්ත ආඛ්‍යානයක් මගින් විස්තර කරනුයේ කොළඹ නගරයේ ජීවත් වන දුප්පත් ජනතාව පොලීසියෙන් පැමිණ ඉවත් කිරීම ජනතාවගේ දුක ප්‍රකාශ කිරීමත් ය.

යම පළුවො ලෙසින් ඉන්නා "පොලිස්" කාරයෝ විත්
දැඩි වදන කියා සිත්හි මදක්වත් නොවී දුක්
"කඩකඩව තොපේ පොල්පත් ගෙවල් දැන" කියාලා
සුනුවිසුනු කරත් දුප්පත් අපේ පැල් මෙකල්හි

( යම පල්ලන් ලෙස පොලිසිය පැමිණ තොපේ පැල්පත් කඩනවා යැයි පවසමින් අපේ ගෙවල් විනාශ කරති)

19වන සියවසෙහි බිහි වූ සිංහල පද්‍ය ආඛ්‍යාන මහනුවර හෝ මාතර සාහිත්‍ය කාල පරිච්ඡේදයන්හි දක්නට ලැබුණු සාහිත්‍ය ප්‍රවණතාවන් ඉක්මවීමකි. කොළඹ සාහිත්‍ය යුගයේ මුල් පසුබිම පෙන්නුම් කරන්නක් ලෙස ද හැඳින්විය හැකි ය. යටත් විජිත සමාජ සන්දර්භය තුළ මුද්‍රණ ශිල්පය ව්‍යාප්තියත් සමඟ ඇති වූ චින්තන ධාරාවේ වෙනස් වීම නව කාව්‍ය සම්ප්‍රදාය වෙනස් කිරීමට හේතු විය. මෙම කාව්‍ය සම්ප්‍රදායට සිංහල සාහිත්‍ය ඉතිහාසයෙහි නිශ්චිත ස්ථානයක් දිය නොහැකිය යන සරච්චන්ද්‍ර මතය එකහෙලා ම පිළිගත නොහැකිය. (sarathchandra,1973:243) මෙම කාල පරිච්ඡේදය වන විට ඉංග්‍රීසි පද්‍ය පිළිබඳව මධ්‍යම පාංතික ජනතාව දැනගෙන සිටිය ද සිංහල පද්‍ය සම්ප්‍රදාය කෙරෙහි එය දැඩි බලපෑමක් සිදු වී නොමැත.

යටත් විජිත සමාජ ක්‍රමය තුළ සමාජ සංස්කෘතික ජීවිතය ද ජන විඥානය ද ක්‍රමයෙන් වෙනස් විය. ජනයා නව ක්‍රමයකින් සිතන්නට විය. සම්ප්‍රදාය අභියෝගයට ලක් විය. නව තාක්ෂණික ඥානය, සන්නිවේදන ක්‍රම හා මාර්ග පද්ධතිය වැනි භෞතික දෑ වෙනස්වන විට චින්තනය ද වෙනස් විය (sharkey j, 2003). මුද්‍රණ ශිල්පය හා සන්නිවේදනය ව්‍යාප්ත වන විට ජාතිකත්වය පිළිබඳව රචනා වූ ලිපි, කවි, නවකථා ආදිය ද යටත් විජිත සමාජ ක්‍රමයෙහි ගොඩ නැගිණි. මෙම අදහස Sharkey J, Heather ප්‍රකාශ කරන අතර ම ශ්‍රී ලාංකේය සමාජ ක්‍රමය තුළ මුද්‍රණ ශිල්පය ව්‍යාප්තියත් සමඟ 19වන සියවසෙහි රචනා වූ පද්‍ය කෘතීන්හි ජාතිකත්වය ඔප්නංවන පද්‍ය නිර්මාණ හමු නොවේ. Benedict Anderson ගේ අදහස වූයේ ජනයාගේ පැවැත්ම උදෙසා අවිඥානවකව හෝ සවිඥානවක ජාතිකත්වය පිළිබඳව අදහස ඉස්මතු වන බවකි. මුද්‍රණ ශිල්පය ද මේ සඳහා වහල් කොට ගන්නා ආකාරය ද පෙන්වා දෙයි. මෙම අදහස 19වන සියවසේ ශ්‍රී ලාංකේය සමාජ ක්‍රමය පැහැදිලි ලෙස දැකිය නොහැකි වුවත් අමද්‍යප ව්‍යාපාරය හරහා ගොඩ නැගුණු බෞද්ධ පුනරුද ව්‍යාපාරය ජාතිකත්වය පිළිබඳ අදහස වඩා ඉස්මතු කරලීමට අවශ්‍ය පසුබිම සකස් කර ඇති ආකාරය ද දැක ගත හැකි යි. එසේ ම එය දේශපාලන ව්‍යාපාරයක් වශයෙන් ද ගොඩ නැගිණි (De Silva:259) .

## *නිගමනය (Conclution)*

සමස්ත කාව්‍යාවලිය තුළ ම දැකගත හැකි පොදු ලක්ෂණය වන්නේ විදග්ධ හා ජන සම්ප්‍රදාය යන දෙකම නව කාව්‍ය සම්ප්‍රදාය තුළ නියෝජනය සිදු වූ බවකි. එමෙන් ම පොදු සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් කවිය සමාජගත වීම ද මෙම සන්දර්භය තුළ දැක ගත හැකි

වීමය. මේ වූ කලී මුද්‍රණ ව්‍යාපාරය හා ගොඩ නැගුණු කාව්‍ය සම්ප්‍රදායක ලක්ෂණ ම වේ. මේ වූකලී සමාජ ක්‍රමය වෙනස් විට කවියෙහි ද වෙනස්වීමකි. ස්ථාවර වූ කාව්‍ය සම්ප්‍රදායක ලක්ෂණ පෙන්නුම් නොකිරීම හා භාෂාව භාවිත කිරීම විරිත් හා වස්තු විෂයයන්ගේ භාවිතයෙහි ඇති නව ප්‍රවණතා හේතුවෙන් මෙම කාව්‍ය සම්ප්‍රදාය වූ කලී සිංහල පද්‍ය සාහිත්‍ය වංශ කථාවේ සංක්‍රාන්ති කාල පරිච්ඡේදයක පද්‍ය සම්ප්‍රදායක් ලෙස පෙන්වා දීම සාධාරණ ය. එසේ නොවන්නේ නම් 19වන සියවසේ පද්‍ය සාහිත්‍ය ලෙස හඳුන්වා දීම ද සාධාරණ බව පෙන්වා දිය හැකි ය.

## *ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය (Reference)*


අප්පුහාමි, දොන් විලියම් (1894) **ස්ත්‍රී ඥානාභිලාශය හෙවත් ඉතිරි නැත අබිලස** , සේදවත්තේ පදිංචි උඩවත්තේ අප්පුහාමිලාගේ කොළඹ ලංකාභිනව විශ්‍රැත යන්ත්‍රාලයේ අච්චුගස්සන ලදී .

අප්පුහාමි බු. ව. 2437: **තුන් යහලු පුවත කාපිරි කුමාරයාගේ කතාව තර්ක ජාතක කාව්‍යය**

උම්මග්ග ජාතක කාව්‍යය. (1874).

**කවිශේඛර** .(1895). කුම්මාස පිණ්ඩ ජාතක කාව්‍යය.

චන්ද්‍රසිරි හිමි, ඔලගන්වත්තේ . (2008). **නූතන සිංහල පද්‍ය සාහිත්‍යයෙහි පසුබිම**, කොළඹ: එස් ගොඩගේ ප්‍රකාශකයෝ.

**තේමිය ජාතක විරිඳු පොත**. (1886) .

නැකත්තා, මාතලේ .(1894).**කුස රාජ මංගල්‍යය**.

**මක්කල හටනේ හෙවත් සිංහල මරක්කල කෝලාහලය,**

පෙරේරා ,කේ. ආර්.(1886). **දේව ධර්ම ජාතකය**.

**පෙරකදෝරු හටනේ** .(1869) .අච්චු ගස්වන්ට යෙදුනේ කොළඹ දී ය .

ප්‍රේරා ,හෙන්ද්‍රික්. (1877).

ප්‍රේරා, සි. (1892) .**කටුගම්පල හටනය** , ලක්රිකිරණ මුද්‍රණාලය.

රාජකරුණා, ආරිය (2008) **නූතන සිංහල කාව්‍යය : 1850 - 1960 : ( විසි වැනි ශතවර්ෂයේ ශ්‍රී ලංකාවේ භාෂා සාහිත්‍ය ලක්ෂණ** ) සංස් : කේ ජයතිලක ඇතුළු තවත් අය, කොළඹ: එස්.ගොඩගේ සහ සහෝදරයෝ .

**වෙළඳ රාජ මංගල්‍යය.** (1893).

**සත්‍යාලංකාරය** . (1876). ක් මැයි ඔක්තෝම්බර් 4 වෙනි බදාදා - -
4කාණ්ඩය - 113 වෙනි පත්‍රය.
සරච්චන්ද්‍ර, එදිරවීර. (1997). **සිංහල නවකථා ඉතිහාසය හා විචාරය** .

**සිපිරි මාලය.** (1888). අච්චුගස්වා ප්‍රසිද්ධ කරන්නට යෙදුනේ වී කරෝලිස් අප්පුහාමිය. කොළඹ හිල්විදියේ නො 37 දරණ ලක්මිණි පලග යන්ත්‍රශාලාවේ දී අච්චු ගසන ලදී.

Godak umbura. C. E , (1996) . **Sinhalese Literature**, Department of Cultural Affairs.

Haywood, Ian . **The Revolution in popular literature ( print , Politics and people , 1790 - 1860)**, Cambridge University Press.

Helen Ruth Bass and Diane Morrill. (1998). **Prose and poetry (A Comprensive Guide Undestanding Literature)**, Portalnd, Maine: J. Weston Walch, Publisher.

Levy, J Dore. (1988). **Chiness Narrative Poetry**, United state America: Duke University press.

Sarachchandra. E. R. (1973). **'Language and literature in the nineteenth and twentieth centuries' , Univerity of Ceylon , History of Ceylon** - Volume three., ed. K.M.de silva, Printed for the Univeristy of Ceylon.

Sharkey J, Heather .(2003). **Living with Colonialism (Nationalism and Culture in the Anglo Egyptian Sudan)** , London: University of California Press.

Silva ,de w Athur . (1917) . **The Popurar poetry of the Sinhalese** , ( reprint from Journal No.68 Part 1., Volume xxiv ., 1915 – 16 , of the Royal Asiatic Society , Ceylon Branch ) , The Colombo : Apothecaries Co. ltd.

Silva K.M .de.(2003). **Nineteenth Century Origins of Nationalism in Ceylon, History of Ceylon**. Volume three, Ed. K.M.de silva, Printed for the Univeristy of Ceylon.

Targeting Text .(2002) . **Blek education , Narrative , Poetry , Drama** .

Wickremasinghe .Nira. (2006) .**Sri Lanka in the Modern Age ,A History of Contested Identities**, London: Hurst & Company.

**Narrative can be divided into traditional fiction including folktales fairly tales , parables, fables , moral tales , myths and legends ; and modern fiction which includes modern fantasy and contemporary fiction. There are at least our in a*

*narratives : Orinetation , complication ,series of events , Resolutions and Reotentation .*

*[1]( google book -*

*http://books.google.co.uk/books?id=o3YiDOT4Zq8C&printsec=frontcover&dq=narrative+poetry&hl=en&ei=FjljTYzhB8rprQe5tLm6Ag&sa=X&oi=book_result&ct=book-thumbnail&*

*[2] He has described popular poetry as Buddhist stories, The story of Pattini , Religious Ballads, Secular Stories Cultivator's Songs*

*[3]මෙම කෘතියේ දී 19වන සියවසේ මුද්‍රණයෙන් ප්‍රකාශයට පත් වී ඇති පද්‍ය කෘති වර්ග 16 ක් යටතේ වර්ග කොට ඇත.*

*[4]The transfomatoin of popular literature in the 1840 s can only be fully understood by placeing it within a longer process of political and cultural change.*

*"[5]With the growth of the Sinhala printing industry in the latter half of the 19th centuray a considerable number of ballads concening Buddhist themes and folk literature came to be printed . These had existed as oral literature earlier and also in manuscript from . This literature when printed was meant for the ordinary Sinhala Buddhist reader , and it would have created a novel awakening among them." Tilak Kularathna p.175*

*[6] මෙම පොත වරුස 1870 වේ දී කොළඹ ජම්පටා වීදියේ පදිංචි පෞලිස් ප්‍රනාන්දු විසින් ඊ. ඇස් ලවා සම්පාදනය කර අච්චුගස්වා ප්‍රසිද්ධ කරන ලදි , කොළඹ හිල්වීදියේ නො . 37 දරණ ලක්මිණි පලග යන්ත්‍ර ශාලාවේ දී අච්චුගස්සන ලදී . 1891.*

*** See , Orsini's book , Print and pleasure*